# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2026.02.27 |


## කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය 2026 පෙබරවාරි මාසයේ දී පහළ ගියේය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2026 පෙබරවාරි මාසයේ දී පහළ ගියේය. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය, 2026 ජනවාරි මාසයේ දී පැවති සියයට 2.3ට සාපේක්ෂව 2026 පෙබරවාරි මාසයේ දී සියයට 1.6ක් ලෙස වාර්තා විය.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2026 ජනවාරි | 2026 පෙබරවාරි |
|---|---|---|
| දර්ශක අගය | 197.0 | 195.3 |
| මාසික වෙනස (%) | 0.6 | -0.9 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 2.3 | 1.6 |

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2026 ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 3.3ක ආහාර උද්ධමනය 2026 පෙබරවාරි මාසයේ දී සියයට 0.2ක් දක්වා අඩුවීමක් පෙන්නුම් කළේය. ආහාර නොවන උද්ධමනය 2026 ජනවාරි මාසයේ පැවති සියයට 1.8ට සාපේක්ෂව 2026 පෙබරවාරි මාසයේදී සියයට 2.3ක් දක්වා ඉහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික % වෙනස සඳහා දායකත්වය**




කො.පා.මි. දර්ශකයෙහි මාසික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2026 පෙබරවාරි මාසයේ දී සියයට 0.85කින් පහළ යාමක් වාර්තා කළේය. ආහාර කාණ්ඩය, ප්‍රධාන වශයෙන් එළවලු සහ අමු මිරිස් මිල විශාල ලෙස පහළ යෑම හේතුවෙන්, මෙම අඩුවීමට ප්‍රතිශතාංක -0.86කින් දායක විය. ඒ අතර, ආහාර නොවන කාණ්ඩය ප්‍රතිශතාංක 0.01කින් දායකත්වයක් දැක්වීය.

මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන මූලික උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2026 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 2.3හි සිට 2026 පෙබරවාරි මාසයේ දී සියයට 2.1 දක්වා පහළ ගියේය.

සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, 2026 වසරේ දෙවන භාගයේ දී උද්ධමනය සියයට 5ක ඉලක්කය කරා ක්‍රමයෙන් ගමන් කරනු ඇතැයි 2026 ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී සිදු කළ උද්ධමන පුරෝකථන මගින් පෙන්නුම් කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය**
**2026 ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2026 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ.

(ආ) උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

*§ 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.*

***මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන***

---

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2025 | පෙබරවාරි | 192.2 | 178.5 | -0.2 | 0.1 | -4.2 | 0.7 | -0.5 | 3.0 |
| | මාර්තු | 191.6 | 178.6 | -0.3 | 0.1 | -2.6 | 0.7 | -0.8 | 2.8 |
| | අප්‍රේල් | 191.2 | 178.8 | -0.2 | 0.1 | -2.0 | 0.8 | -1.1 | 2.6 |
| | මැයි | 192.8 | 179.2 | 0.8 | 0.2 | -0.7 | 1.2 | -1.2 | 2.4 |
| | ජූනි | 194.5 | 180.1 | 0.9 | 0.5 | -0.6 | 1.5 | -1.4 | 2.1 |
| | ජූලි | 194.1 | 180.8 | -0.2 | 0.4 | -0.3 | 1.6 | -1.6 | 1.9 |
| | අගෝස්තු | 193.3 | 180.9 | -0.4 | 0.1 | 1.2 | 2.0 | -1.5 | 1.8 |
| | සැප්තැම්බර් | 193.7 | 181.2 | 0.2 | 0.2 | 1.5 | 2.0 | -1.4 | 1.7 |
| | ඔක්තෝබර් | 193.8 | 181.4 | 0.1 | 0.1 | 2.1 | 2.2 | -1.2 | 1.6 |
| | නොවැම්බර් | 193.4 | 181.3 | -0.2 | -0.1 | 2.1 | 2.4 | -0.8 | 1.6 |
| | දෙසැම්බර් | 195.8 | 181.8 | 1.2 | 0.3 | 2.1 | 2.7 | -0.5 | 1.6 |
| 2026 | ජනවාරි | 197.0 | 182.5 | 0.6 | 0.4 | 2.3 | 2.3 | 0.0 | 1.7 |
| | පෙබරවාරි | 195.3 | 182.3 | -0.9 | -0.1 | 1.6 | 2.1 | 0.5 | 1.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.